කැලණිය විශ්වවිද්‍යාලය
களனிப் பல்கலைக்கழகம்
UNIVERSITY OF KELANIYA

මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது இல
Your No.

2024.09.27

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

<u>උපාධි ප්‍රදානෝත්සවය -2024 ඔක්තෝබර් මස 18 - තෙවන සැසිය.</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ **වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ , පරිගණක හා තාක්ෂණ පීඨයේ හා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ** උපාධි පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් උපාධිලාභී වූවන්ට උපාධි ප්‍රදානය කිරීම සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය <u>2024 **ඔක්තෝබර් මස 18**</u> වැනි **සිකුරාදා සවස 3.00 සිට සවස 6.00** දක්වා (තෙවන සැසිය) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ. මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන ලෙස ඔබට මෙයින් සතුටින් ආරාධනය කරමි.

1. **2024.10.12 සෙනසුරාදා** දින **ප.ව 1.30 සිට ප.ව 3.30 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි විභාග අංශයෙන් උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලැබේ.** උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා තම ශිෂ්‍ය හැඳුනුම්පත, ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන පැමිණිය යුතුය. <u>**අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඉහත දැක්වෙන හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිවෙකුට උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු නොලැබේ.**</u> **උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා උපාධිලාභියාම පැමිණිය යුතුය.**

2. උපාධිලාභි නාමලේඛනයේ ඔබගේ නමට හිමි අංකය අනුව උපාධිලාභීන් පිළිවෙළින් දෙදෙනා බැගින් උපාධිලාභීන්ගේ පෙරහැර සඳහා පෙළගැසී සිටිය යුතුය. උපාධිලාභීන්ගේ පෙරහැර ශාලාවට ඇතුළු වූ පසු පැමිණෙන උපාධිලාභීන් කිසිවෙකුටත් උපාධි ශාලාවට ඇතුළු වීමට අවසර දෙනු නොලැබේ.

3. ඔබ වෙනුවෙන් උපාධි ප්‍රදානෝත්සවය සඳහා ආරාධිතයන් දෙදෙනෙකු සහභාගි කරවා ගැනීමට අවස්ථාව සලසා ඇත. උපාධි ප්‍රදානෝත්සවයේ වැඩ සටහන් විස්තරය සහ ආරාධනා පත්‍ර උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලබන අවස්ථාවේදී ලබාදීමට කටයුතු යොදා ඇත.

4. උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත **ඡායාරූප ගැනීම තහනම් වන අතර, කැමරා සහ ජංගම දුරකථන ශාලාව තුළට ගෙන ඒමටත්, වයස අවුරුදු 12 ට අඩු ළමුන් ශාලාවට ඇතුල් කිරීමටත් අවසර දෙනු නොලැබේ.**

5. උපාධි ප්‍රදානෝත්සවය අවසන් වී දින 07 ක් ඇතුළත (**සෙනසුරාදා හා ඉරිදා** දින හැර) **උපාධි ලෝගු සහ කරමාල විශ්වවිද්‍යාලයට ආපසු භාරදිය යුතු ය. උපාධි ලෝගු සහ කරමාල භාරදීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම රුපියල් 50/- ක අතිරේක ගෙවීමක් කිරීමට සිදුවේ. තවද උපාධි ලෝගුවට සහ කරමාලයට කිසියම් හානියක් සිදුවුවහොත් එහි වටිනාකම සමග <u>අතිරේක 25% ක ගාස්තුවක්</u>** ගෙවීමට සිදුවන බව ද මෙයින් දන්වමි.

6. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන පිරිමි උපාධිලාභීහු ජාතික ඇඳුම හෝ යුරෝපීය ඇඳුම ඇඳිය යුත්තාහ. කාන්තා උපාධිලාභීන් පෙරදිග සිරිත අනුව විචිත්‍රවර්ණයෙන් හා උත්සව විලාසයෙන් පැමිණිය යුතුය.

7. උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ ඡායාරූප ලබා ගැනීමට පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සලසා ඇත. ඡායාරූප ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා නියමිත මුදල විශ්වවිද්‍යාලය විසින් අවසරය ලබා දී ඇති ඡායාරූප ශිල්පියා වෙත උපාධි ලෝගු ලබාගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතුය. (පෞද්ගලික ඡායාරූප ශිල්පීන් සඳහා උපාධි ශාලාව තුළට පිවිසීමට ඉඩ දෙනු නොලැබේ.)

8. උපාධි ප්‍රදානෝත්සවයේ අදාළ සැසිය අවසන් වීමෙන් පසු <u>බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුළුවන ප්‍රධාන දොරටුවේ ඇති කවුන්ටර් වෙත උපාධි ලෝගුව හා කරමාලය භාර දී උපාධි සහතිකය ලබා ගත හැකිය.</u>

9. කැලණිය විශ්වවිද්‍යාලයේ **<u>www.news.kln.ac.lk</u>** වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ <u>011-2903112,114 දුරකථන අංක ඇමතීමෙන්</u> වැඩි විස්තර ලබාගන්නා ලෙස කාරුණිකව දන්වමි.

මෙම ලිපිය උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වීම සඳහා ඔබට කෙරෙන ආරාධනයක් සේ සලකන්න.

ආර්.ලෝගේන්ද්‍ර
නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග
ලේඛකාධිකාරී වෙනුවට

ආර්. ලෝගේන්ද්‍ර
නියෝජ්‍ය ලේඛකාධිකාරි
විභාග අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

27.09.2024

Dear Sir/ Dear Madam,

**Convocation – 18th October 2024 – Third Session**

The Convocation for the conferment of degrees to the Graduands of the **Faculty of Commerce & Management Studies , Faculty of Computing & Technology and Gampaha Wickramarachchi Ayurveda Institute of the University of Kelaniya** will be held from 3.00 p.m to 6.00 p.m (Third Session) on **Friday**, **18th October 2024** at the **Bandaranaike Memorial International Conference Hall, (BMICH) Sri Lanka.**

You are kindly invited to be present at this Convocation.

1. The **Cloaks** and **Garlands** will be issued on **Saturday 12th October 2024** from **1.30 p.m.** to **3.30 p.m**. at the **Examinations Branch of the University of Kelaniya**. You are required to produce your **Student's Identity Card**, **National Identity** Card or **Passport** in order to obtain Cloaks and Garlands. **Cloaks and Garlands will not be issued to those who fail to produce any of those to prove their identity.**

2. The number assigned to you in the List of Graduands is indicated at the end of this letter and you must appear in the Procession of the Graduands according to the number given. No Graduands will be permitted to enter the Convocation Hall after the Graduands Procession enters into the Convocation Hall.

3. You will receive two invitations for your invitees and the programme of the Convocation when you obtain cloaks & garlands.

4. **Taking photographs inside the Convocation Hall is strictly prohibited. No one is permitted to take Cameras and Cellular Phones and bring Children into the hall.**

5. Cloaks and Garlands should be returned to the University **within 07 days(Except Saturdays & Sundays)** after the Convocation. Rs. 50/- will be charged for each day of delay from those who fail to return the Cloaks and Garlands. You are informed that if any damage caused to **the cloak and garland you are required to pay its value and additional amount of 25% of it.**

6. Arrangements have been made for you to obtain photographs at the Convocation. Details will be available to you, when you obtain Cloaks and Garlands.**(Other photographers are not permitted to enter the convocation hall)**

7. **At the end of the relevant session of the convocation you can hand over the cloak and the garland to the counter at the main entrance of the BMICH and you can collect your Degree Certificate on the same day.**

8. You are kindly requested to visit the University of Kelaniya website www.news.kln.ac.lk to get further information.

9. Please consider this letter as an **invitation** for you to participate in the Convocation.

**R.Logendra**
**Deputy Registrar/Examinations**
**for Registrar**
**011-2903112,114**

R. Logendra
Deputy Registrar
Examinations Division
University of Kelaniya
Sri Lanka